ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය Business & Accounting Studies

| 60 | S | I, II |
|---|---|---|

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2024 (2025 ජනවාරි)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024 (2025 ஜனவரி)
Genaral Certificate of Education (Ord. Level) Examination, 2024 (January 2025)

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II**
**வணிகக் கல்வியும் கணக்கீடும் I, II**
**Business and Accounting Studies I, II**

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

**උපදෙස් :** * ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

01. පහත සිද්ධිය ඇසුරෙන් අංක (i) සිට (x) දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ශ්‍රී ජයවර්ධනපුර කලාපයේ නොවිධිමත් අධ්‍යාපන ඒකකය විසින් මෙහෙය වන ලද ඇඳුම් මැසීම පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් හැදෑරූ ප්‍රියන්වදා පෙරේරා ඇඳුම් මැසීම පිළිබඳ විශේෂ නිපුණතාවක් ලබා ගත්තා ය. ඇය ළමා ඇඳුම් මැසීම හා අලෙවි කිරීම සඳහා තම ඉඩමේ රු. 1,000,000ක් වැය කර ගොඩනැගිල්ලක් ඉදිකර ගත්තා ය. 2024.01.01 දින ඒ සඳහා මුදලින් රු. 800,000 ක් ද ඈ යෙදවූ අතර එයින් රු. 150,000ක් වටිනා මහන මැෂිමක් ද රු. 200,000 ක රෙදි ද මිලට ගත්තා ය.

ඇය තම සහයට තමා සමග මැහුම් ඩිප්ලෝමාව හැදෑරූ රවීනා බඳවා ගත් අතර ප්‍රියන්වදා විසින් රවීනාට කළ යුතු වැඩ කොටස් බෙදා දුන්නා ය. ඇයට සාරි ජැකට් මැසීම පිළිබඳ පුහුණුවක් ලබා දීමට සැළසුම් කළ අතර වර්ෂය අවසානය වන විට ප්‍රදේශයේ ඇඟළුම් කම්හලකට අවශ්‍ය ඇඟළුම් වලින් කොටසක් කොමිස් පදනම මත මසා දීමට ප්‍රියන්වදා සැලසුම් කළා ය. 2024.01.01 සිට 2024.01.31 පහත ගනුදෙනු සිදුවිය.

| | | |
|---|---|---|
| 2024.01.04 | නූල් හා බොත්තම් මිලට ගැනීම | රු. 50,000 |
| 2024.01.05 | මහන මැෂින් ගෙන ඒමේ කුලී | රු. 20,000 |
| 2024.01.10 | බැංකු ජංගම ගිණුමක් විවෘත කළා | රු. 120,000 |
| 2024.01.12 | රවීනාට වැටුප් අත්තිකාරම් ගෙව්වා | රු. 40,000 |
| 2024.01.28 | මාසික විදුලි බිල ගෙව්වා | රු. 7,000 |
| 2024.01.30 | මහන මැෂින් අලුත් වැඩියාව | රු. 10,000 |

2024 ජනවාරි 31 දින වන විට මෙම ව්‍යාපාරය ළමා කමිස 300ක් ද ළමා කලිසම් 300ක් ද මසා නිම කළ අතර කමිසයක් රු. 800 බැගින් ද කලිසමක් රු. 1,000 බැගින් ද අලෙවි කර ඇත.

**(i)** අ. ඉහත සිද්ධියේ සඳහන් වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් ද?
ආ. එම සංවිධාන ක්‍රමයේ වාසියක් හා අවාසියක් සඳහන් කරන්න.

**(ii)** මෙම සිද්ධියේ දැකිය හැකි ශක්තියක් හා අවස්ථාවක් ලියන්න.

**(iii)** ඉහත සිද්ධියේ සඳහන් කළමණාකරණ කාර්යයන් 02 ක් නම් කර නිදසුන් ඉදිරිපත් කරන්න.

**(iv)** අ. මෙම සිද්ධියේ සඳහන් නිෂ්පාදක සාධක 02ක් නම් කර උදාහරණය බැගින් ලියන්න.
ආ. මෙම සිද්ධියේ සඳහන් තෝරා ගත් පාරිභෝගික කොටස නම් කර අලෙවිකරණයේ දී එය හඳුන්වන්නේ කුමන නමකින් ද?

**(v)** 2024.01.01 දිනට ගිණුම්කරණ සමීකරණය ලියා දක්වන්න.

**(vi)** 2024.01.01 සිට 2024.01.31 දක්වා අදාළ ගනුදෙනු සටහන් කර මුදල් පොත පිළියෙල කරන්න.

**(vii)** අ. මෙම ව්‍යාපාරයෙන් හඳුනාගත හැකි සෘජු ද්‍රව්‍ය හා වක්‍ර ද්‍රව්‍ය සඳහා නිදසුන් බැගින් ලියන්න.
ආ. මහන මැෂිමේ පිරිවැය ගණනය කරන්න.

**(viii)** අ. 2024.01.10 සිදුවූ ගනුදෙනු සඳහා ද්විත්ව සටහන ලියන්න.
ආ. මහන මැෂිම වාර්ෂිකව 10% බැගින් ක්ෂය කරන්නේ නම් මෙම කාල පරිච්ඡේදයට අදාල ක්ෂය ගණනය කරන්න.

**(ix)** අ. විකුණුම් ආදායම ගණනය කරන්න.
ආ. 2024 ජනවාරි මාසයේ වෙළෙඳ ලාභය කීයද ?

**(x)** 2024.01.31 ජංගම නොවන වත්කම් වල අගය කීයද ?

(ලකුණු 02 x 10 = 20 යි)

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය
(ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.)

02. (i) අ. නිෂ්පාදක සාධක යන්න අර්ථ දක්වන්න.
ආ. ව්‍යවසායකයා විසින් ඉටු කරන කාර්යයන් දෙකක් දක්වන්න. (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.
අ. ව්‍යාපාරයකට ඇල්මැති පාර්ශවයක් ලෙස සේවකයන්ගේ අරමුණු වන්නේ රැකියා සුරක්ෂිත බවයි.
ආ. නිෂ්පාදන කාර්යයේ දී යොදා ගන්නා කර්මාන්ත ශාලාව නිෂ්පාදක සාධකයක් වන භූමියට අයත්වේ
ඉ. ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව, යොදවා ඇති ප්‍රාග්ධන ප්‍රමාණය අනුව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයක් ද යන්න හඳුනා ගනියි.
ඊ. ව්‍යාපාරයක බාහිර පරිසරය අධ්‍යයනය කිරීම තුලින් එම ව්‍යාපාරයට ඇති අවස්ථා හා තර්ජන හඳුනාගත හැකිය. (ලකුණු 02 යි)

(iii) අ. දේශීය ව්‍යාපාර සඳහා ගෝලීය පරිසරයෙන් සිදුවෙන වාසි 02ක් දක්වන්න.
ආ. පාරිභෝගිකයන්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා රජය පිහිටුවා ඇති ආයතනය නම් කරන්න. (ලකුණු 02 යි)

(iv) අ. "ව්‍යාපාර සංවිධානයක්" යන්න කෙටියෙන් හඳුන්වන්න.
ආ. පහත දැක්වෙන ව්‍යාපාර, හිමිකාරිත්වය අනුව වර්ග කර දක්වන්න.
**A** - සී/ස මන්දිරා සමාගම
**B** - අධ්‍යාපන සේවකයින්ගේ සමූපකාර සමිතිය
**C** - ජාතික ඉතිරිකිරීමේ බැංකුව
**D** - ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව (ලකුණු 02 යි)

**(මුළු ලකුණු 08 යි)**

03. (i) අ. "උපකාරක සේවා" යනු කුමක් ද?
ආ. තොග වෙළෙඳාමේ දක්නට ලැබෙන ලක්ෂණ දෙකක් දක්වන්න. (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.
අ. රක්ෂණ ඔප්පුවක් ලබා ගැනීමේ දී රක්ෂකයා හා රක්ෂිතයා රක්ෂණ ගිවිසුමට සම්බන්ධ සියලු තොරතුරු හෙළි කළ යුතු නොවේ.
ආ. හරපත් ලබා ගැනීම සඳහා බැංකු ගිණුමක් පවත්වාගෙන යාම අනිවාර්ය වේ.
ඉ. මිනිස් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීම සඳහා වටිනාකමකින් යුත් නිෂ්පාදනයක් නිර්මාණය කිරීමේ හා පිළිගැන්වීමේ ක්‍රියාවලිය අළෙවිකරණයයි.
ඊ. තම කාර්යයන් නිසි ලෙස ඉටු කිරීමට සේවකයින් පෙළඹවීම පාලනය ලෙස හැඳින්වේ. (ලකුණු 02 යි)

(iii) ගුණාත්මක හා පෝෂදායී ආහාර වර්ග නිෂ්පාදන ආයතනයක ක්‍රියාවලීන් කිහිපයක් පහත දැක්වේ.
අ. ආහාර නිෂ්පාදනය සම්බන්ධව කළමණාකරුවන් පත්කිරීම හා අවශ්‍ය සම්පත් ලබා දීම.
ආ. නිෂ්පාදනය කළ යුතු ආහාර වර්ග පිළිබඳ තීරණය කිරීම.
ඉ. නිෂ්පාදිත ආහාර වල අඩුපාඩු මග හරවා ගැනීමට අවශ්‍ය දෑ එක්කිරීම.
ඊ. නිෂ්පාදන කලමණාකරුවන් තම සේවකයන්ට උපදෙස් ලබා දීම.
ඉහත සිද්ධීන්ට අදාල කළමණාකරණ ක්‍රියාවලියේ කාර්යයන් අනුපිළිවෙලින් දක්වන්න. (ලකුණු 02 යි)

(iv) විසිතුරු <u>කඩදාසි බෑග්</u> නිෂ්පාදනය කරන පියල් උත්සව සමයේ <u>10% වෙළෙඳ වට්ටමකට</u> නිෂ්පාදන සපයන බව <u>වෙබ් අඩවිය</u> මගින් දැනුම් දී ඇත. එය <u>කොළඹ අවට ප්‍රදේශ</u> වලින් ලබා ගත හැකි බවද දන්වා ඇත.
අ. මෙහි ඉරි ඇඳි පද වලට අදාල අලෙවිකරණ මිශ්‍රයන් නම් කරන්න.
ආ. සුදුසු ආයෝජන මාර්ගයක තෝරා ගැනීමේ දී සලකා බලන සාධක දෙකක් ලියන්න. (ලකුණු 02 යි)

## II කොටස - ගිණුම්කරණය
(ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.)

04. (i) ගොඩනැගිලි ඉදිකිරීමේ ද්‍රව්‍ය අළෙවිකරණ දුෂ්මන්තගේ ව්‍යාපාරයේ 2024 ජුනි මාසයේ මුල් දින කිහිපයක් තුළ සිදුවූ ගනුදෙනු වලට අදාලව ගිණුම් තබන්නා විසින් සකස් කළ ගිණුම්කරණ සමීකරණය පහත දී ඇත.

| ගනුදෙනුව | වත්කම් | | | | = | හිමිකම් | + වගකීම් | |
|---|---|---|---|---|---|---|---|---|
| | ගොඩනැගිලි | උපකරණ | තොගය | ණයගැතියෝ | මුදල් | ප්‍රාග්ධනය | බැංකු ණය | ණයහිමියෝ |
| 2024.06.01 ශේෂය | 100,000 | 50,000 | 87,000 | 8,800 | 53,200 | 160,000 | 75,000 | 64,000 |
| 01 | | + 25,000 | | | | + 25,000 | | |
| 02 | | | - 15,000 | + 16,500 | | + 1,500 | | |
| 03 | | | + 43,000 | | | | | + 43,000 |
| 04 | | | | | - 1,000 | - 1,000 | | |
| එකතුව | | | | | | | | |

ව්‍යාපාරයේ අයිතිකරු විසින් මුදල් හෝ භාණ්ඩ කිසිවක් ගැනිලි ලෙස සිදුකර නැත.

**ඔබ විසින්,**

අ. ඉහත ගිණුම්කරණ සමීකරණයේ දක්වා ඇති එක් එක් ගනුදෙනුව වටිනාකම සහිතව ලියා දක්වන්න.

ආ. ගනුදෙනු අවසානයේ දුෂ්මන්තගේ ව්‍යාපාරයේ පහත අයිතම වල වටිනාකම සොයන්න.

**i.** ජංගම නොවන වත්කම් **ii.** ජංගම වත්කම්

**iii.** හිමිකම **iv.** ජංගම වගකීම් (ලකුණු 04 යි)

**(ii)** තාරකාගේ ව්‍යාපාරයේ 2024 ජුනි මාසයේ ව්‍යාපාරය සඳහා පිළියල කරන ලද බැංකු ගිණුම හා බැංකුව විසින් එවන ලද බැංකු ගිණුම් විස්තරය පහත දී ඇත.

**බැංකු ගිණුම**

| | | | | | |
|---|---|---|---|---|---|
| 6/1 | ශේෂය ඉ/ගෙ | 85,700 | 6/5 | රක්ෂණය (120240) | 8,450 |
| 6/3 | මුදල් තැන්පතු | 15,000 | 6/12 | ජල බිල් (120241) | 1,670 |
| 6/8 | චෙක් තැන්පතු (200110) | 17,000 | 6/15 | සේවක වැටුප් (120242) | 16,000 |
| 6/9 | මුදල් තැන්පතු | 12,500 | 6/20 | ණයහිමියෝ (120243) | 9,400 |
| 6/28 | චෙක් තැන්පතු (310411) | 3,600 | 6/28 | විදුලි ගාස්තු (120244) | 3,700 |
| 6/29 | චෙක් තැන්පතු (411218) | 8,300 | 6/29 | ණයහිමි (120245) | 24,300 |
| | | | 6/30 | ශේෂය ප/ගෙ | 78,580 |
| | | 142,100 | | | 142,100 |
| 7/01 | ශේෂය ඉ/ගෙ | 78,580 | | | |

**2024 ජුනි මාසයේ බැංකු ගිණුම් විස්තරය**

| දිනය | විස්තරය | හර | බැර | ශේෂය |
|---|---|---|---|---|
| 2024/6/01 | ශේෂය ඉ/ගෙ | | | 85,700 |
| 6/03 | මුදල් තැන්පතු | | 15,000 | 100,700 |
| 6/05 | ස්ථාවර නියෝග-ණය වාරික | 18,450 | | 82,250 |
| 6/07 | චෙක් (120240) | 8,450 | | 73,800 |
| 6/09 | මුදල් තැන්පතු | | 12,500 | 86,300 |
| 6/12 | චෙක් (200110) | | 17,000 | 103,300 |
| 6/15 | චෙක් (120241) | 1,670 | | 101,630 |
| 6/18 | චෙක්පොත් ගාස්තු | 860 | | 100,770 |
| 6/19 | ණයගැති ප්‍රේෂණ | | 13,000 | 113,770 |
| 6/20 | චෙක් (120242) | 16,000 | | 97,700 |
| 6/25 | චෙක් (120243) | 9,400 | | 88,370 |

**අවශ්‍ය වන්නේ,**

අ. 2024 ජුනි 30 දිනට සංශෝධිත බැංකු ගිණුම

ආ. 2024. ජුනි මාසය සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කරන්න. (ලකුණු 04 යි)

**(iii)** පහත දැක්වෙනුයේ කමල්සිරිගේ ව්‍යාපාරයේ 2024 ජනවාරි මාසයේ සිදුවූ සුළු වියදම් පිළිබඳ විස්තරයකි. ගමන්, තැපැල්, ලිපිද්‍රව්‍ය හා විවිධ වියදම් යන ලෙජර තීරු ද සහිත අග්‍රිම ක්‍රමයට සකස් කළ සුළු මුදල් පොතක එම ගනුදෙනු ලියා සුළු මුදල් පොත තුලනය කර දක්වන්න.

| | | |
|---|---|---|
| 2024.01.01 | ප්‍රධාන මුදල් පාලකගෙන් ලැබුන මුදල | රු. 4,000 |
| 01.03 | ගමන් වියදම් ගෙවීම | රු. 175 |
| 01.06 | තැපල් ගාස්තු | රු. 270 |
| 01.13 | විදුලි පණිවිඩ | රු. 140 |
| 01.16 | යතුරු ලියන රිබන් | රු. 130 |
| 01.21 | යතුරු ලියන කඩදාසි | රු. 250 |
| 01.23 | ගමන් ගාස්තු | රු. 30 |
| 01.25 | මුද්දර හා ලිපි | රු. 75 |
| 01.28 | සුනිල්ට ගෙවීම් | රු. 500 |
| 01.29 | සංග්‍රහ වියදම් | රු. 250 |
| 01.30 | කාර්යාලයට පුටු දෙකක් ගත්තා | රු. 800 |

(ලකුණු 04 යි)

**(මුළු ලකුණු 12 යි)**

05. **(i)** මල් පෝච්චි නිෂ්පාදනය කරන ව්‍යාපාරයක 2024 මැයි මාසයට අදාළ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

| | |
|---|---|
| නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය | රු. 30,000 |
| මුළු නිෂ්පාදන පිරිවැය | රු. 90,000 |
| සෘජු ශ්‍රම පිරිවැය | රු. 15,000 |
| සෘජු වෙනත් පිරිවැය | රු. 5,000 |
| එක් මල් පෝච්චියක පිරිවැය | රු. 60 |

**අවශ්‍ය වන්නේ,**

අ. මැයි මාසයේ නිෂ්පාදනය කළ මල් පෝච්චි ගණන

ආ. මැයි මාසයේ සෘජු ද්‍රව්‍ය පිරිවැය (ලකුණු 02 යි)

**(ii)** උදාරගේ ව්‍යාපාරයේ 2024.12.31 දිනට පිළියෙල කරන ලද ශේෂ පිරික්සුම පහත දැක්වේ.

**ශේෂ පිරික්සුම**

| | | |
|---|---|---|
| මුදල් | 71,000 | |
| ප්‍රාග්ධනය | | 75,000 |
| ගැණුම් | 15,000 | |
| ණයහිමියෝ | | 12,000 |
| ණයගැතියෝ | 2,000 | |
| වරිපනම් | 16,000 | |
| අවිනිශ්චිත ගිණුම | | 17,000 |
| | 104,000 | 104,000 |

ශේෂ පිරික්සුම පිළියෙල කිරිමෙන් පසුව කරන ලද ගිණුම් පරීක්ෂාවේ දී පහත වැරදි අණාවරණය විය.

1. රු. 18,000ක ගැණුම් ඉන්වොයිසියක් පොත්වල සටහන් කිරිම සම්පූර්ණයෙන්ම මග හැරි ඇත.
2. ගෙවූ රු. 1,600ක වරිපනම් ගාස්තු මුදල් පොතේ නිවැරදිව සටහන් කර ඇතත් වරිපනම් ගිණුමේ සටහන් කර ඇතේ රු. 16,000ක් ලෙස ය.
3. ණයට විකුණුම් රු. 2,400 ක් විකුණුම් ගිණුමට හා ණයගැති ගිණුම යන දෙකටම බැර තර ඇත.
4. රු. 3,700ක ණයට ගැණුම්, ගිණුම් දෙකේම හරට සටහන් කර තිබේ.

**ඔබ විසින්,**

අවිනිශ්චිත ගිණුම පිළියෙල කරන්න. (ලකුණු 02 යි)

**(iii)** කසුනිගේ වෙළඳ ව්‍යාපාරයේ 2024.12.31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

**ශේෂ පිරික්සුම**

| | | |
|---|---|---|
| ප්‍රාග්ධනය | | 200.000 |
| ආරම්භක තොගය - 2024.01.01 | 36,000 | |
| ගැණුම් | 180,000 | |
| විකුණුම් | | 450,000 |
| ණය ගැතියෝ | 158,000 | |
| 12% බැංකු ණය | | 300,000 |
| වේතන | 45,000 | |
| විකුණුම් කොමිස් | 18,000 | |
| මුදල් | 252,000 | |
| ණය පොලි | 30,000 | |
| විදුලිය | 24,000 | |
| යන්ත්‍ර | 400,000 | |
| යන්ත්‍ර ක්ෂය වෙන් කිරිම | | 160,000 |
| ණයහිමියෝ | | 18,000 |
| ලැබූ කුලී | | 15,000 |
| | 1,143,000 | 1,143,000 |

**අමතර තොරතුරු :**

1. 2024.12.31 දිනට තොගයේ පිරිවැය රු. 36,000
2. ණයගැතියන්ගෙන් රු. 3,000 බොල් ණය ලෙස කපා හළ යුතුය.
3. යන්ත්‍ර සරල මාර්ග ක්‍රමයට 10% ක්ෂය කළ යුතුය
4. උපචිත කුලි ආදායම රු. 5,000

සා.පෙළ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන දේශක
සිසිර කුමාර
විසින් සම්පාදිත යි.

**අවශ්‍ය වන්නේ,**

1. 2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශය (ලකුණු 08 යි)
2. 2024.12.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය. **(මුළු ලකුණු 12 යි)**